රහස්‍යයි

ඇගයීම් ශාලාවෙන් පිටතට රැගෙන යාම තහනම්

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

ලකුණු දීමේ පටිපාටිය



(01) ථේරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

පරීක්ෂකවරයාගේ නම :- .....

සංකේත අංකය :- 91/1/2/04/2024/01/S/.....

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. ප්‍රධාන පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

ආයතනික විභාග ඇගයීම් ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත. සියලුම හිමිකම් ඇවිරිණි.

Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

S 1

(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

පැය තුනයි

අතිරේක කියවීම් කාලය - මිනිත්තු 10යි.

- I කොටසේ ප්‍රශ්නය ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සැ. යු. :- I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා II කොටසේ පිළිතුරු ප්‍රත්‍යේකම අමුණා භාර දෙන්න.

Deputy Commissioner of E...
Confidential Unit
Department of Examina...
Pelawatta, Bar...

විභාග අංකය .....

I කොටස

1. (i) ධර්මයෙහි සඳහන් වන සැප දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(ii) ස්කන්ධ පංචකයෙන් හතරක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(iii) "අථඛෝ භගවා රත්තියා පඨමං යාමං පටිච්චසමුප්පාදං අනුලෝමපටිලෝමං මනසාකාසි" පටිච්චසමුප්පාද ධර්මය මෙනෙහි කිරීමේදී බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ නය ක්‍රම දෙක දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(iv) ලෝකය ශූන්‍ය වශයෙන් බලන ලෙස බුදුරජාණන් වහන්සේ වදාළ දෙදෙනෙකුගේ නම් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(v) සම්මා දිට්ඨිය ඇති කර ගැනීම සඳහා ඉවහල්වන කරුණු දෙක දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

[දෙවැනි පිටුව බලන්න.

(vi) ෂඩායතන නම් වශයෙන් දක්වන්න. *(ලකුණු 04 යි)*

.....

.....

.....

.....

.....

.....

(vii) කර්ම දේශනාවේ දී වදාළ නියාම ධර්ම හතරක් ලියන්න. *(ලකුණු 04 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(viii) සමථ භාවනාවට අයත් අනුස්සති ධර්ම හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(ix) සිව් පිරිසිදු සීලයන් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

PAST PAPERS WIKI

(x) පහත සඳහන් ගාථාව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*

න තං කම්මං කතං සාධු

.....

.....

.....

**

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024 **S 1**

(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

● ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

1. (i) නිර්වාණය ද නිර්වාණගාමී මාර්ගය ද මෙලොවදී ම ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ධර්ම සංකල්පයේ නම ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) එම සංකල්පය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කෘත්‍ය හතරක් ධර්මයේ දක්වයි. ඒවා සිංහලෙන් හෝ පාලියෙන් දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) යහපත් දිවිපැවැත්මක් සඳහා දේශනා කර ඇති මාර්ගාංගය නම් කරන්න. *(ලකුණු 08 යි)*

2. (i) පුද්ගලයාගේ විවිධ හැසිරීම් ස්වභාවයන් අනුව චරිත වර්ග හයක් බුදුසමයේ දක්නට ලැබෙයි. එම චරිත වර්ගයන්ගෙන් හතරක් දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) ඔබ නම් කර ඇති එම චරිත වර්ගයන්ගේ ලක්ෂණ හා ඒවාට ගැලපෙන භාවනා විධි කවරේ දැ යි පෙන්වාදෙන්න. *(ලකුණු 06 යි)*

(iii) ආධ්‍යාත්මික වශයෙන් හා ලෞකික වශයෙන් සමථ භාවනාවෙන් ලද හැකි ප්‍රතිඵල කවරේ දැ යි විමසීමට ලක් කරන්න. *(ලකුණු 08 යි)*

3. (i) බුදුරජාණන් වහන්සේ දවස පැවති හේතුඵලවාදී ඉගැන්වීම් සතර ආකාරයකට බෙදා විවරණය කොට උන්වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එම බෙදීම් හතර දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) පටිච්ච සමුප්පාදය විස්තර කිරීමට උපයෝගී කරගනු ලබන තථ, අවිතථ, අනඤ්ඤථා හා ඉදප්පච්චයතා සංකල්පවල අදහස් කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) (අ) ද්වාදසාංග පටිච්ච සමුප්පාදය පිළිවෙළින් නම් කරන්න.

(ආ) 'ඉමස්මිං සති ඉදං හෝති
ඉමස්මිං සති ඉදං න හෝති' මෙමගින් පටිච්චසමුප්පාදයේ මූලික ධර්මතා දෙක පෙන්වාදෙන්න. *(ලකුණු 08 යි)*

4. (i) නිවන දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය ලෙස හැඳින්වීමේ හේතුව ඉදිරිපත් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) නිවනෙහි සෝපාධිසේස අනුපාධිසේස යන වර්ගීකරණය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) නිවන අවබෝධ කර ගැනීමට අනුගමනය කළ යුතු ත්‍රි ශික්ෂා මාර්ගය පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

5. (i) භාරතීය කර්ම සංකල්පයේ විකාශනය පිළිබඳව අවස්ථා හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) අංගුත්තර නිකායේ නිබ්බේධික (පරියාය) සූත්‍රයේ කර්මය විපාක දෙන කාල තුනක් දේශනා කොට ඇත. එම කර්ම තුන දක්වා හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) 'චේතනාවට මුල්තැන දී කර්මය විවරණය කිරීම බෞද්ධ කර්මවාදයේ විශේෂ ලක්ෂණය වේ' හේතු දක්වන්න. *(ලකුණු 08 යි)*

මෙතනින් මෙන් කරන්න.

[හතරවැනි පිටුව බලන්න.

6. (i) (අ) ඇත්ත ඇති සැටියෙන් දැකීම (යථා භූතඤාණදස්සන) සඳහා පාදක වන සිද්ධාන්තයේ නම ලියන්න.

(ආ) ඊට අයත් ප්‍රභේද නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) ලෝකය යන පදය බුදුදහමෙහි විග්‍රහ කර ඇත්තේ කවර ආකාරයෙන් දැ යි පහදා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) 'සබ්බේ සංඛාරා අනිච්චා'

සංස්කාරවල ස්වභාවය වෙනස් වීමයි. කෙටි විවරණයක් මගින් එම ස්වභාවය හඳුන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

7. (i) කුසලාකුසල විනිශ්චය කිරීමේ නිර්ණායක තුනක් අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දක්වා ඇත. එම නිර්ණායක තුන නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) එම නිර්ණායකයන්ට අනුව ප්‍රත්‍යවේක්ෂා ක්‍රියාවලිය තුන් දොරටුවට සම්බන්ධ කර ගන්නේ කෙසේ දැ යි පෙන්වා දෙන්න. *(ලකුණු 07 යි)*

(iii) අකුසල (නරක හැසිරීම) බැහැර කර කුසලය (හොඳ හැසිරීම) සංවර්ධනය කිරීමෙන් පුද්ගල හා සමාජ යහපත සලසා ගත හැකි බව පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

* * *

Past Papers Wiki

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

ලකුණු බෙදියාම

- I කොටස ප්‍රශ්නය ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

1. ප්‍රශ්නය

(i) සිට (v) දක්වා කොටස් වලට = ලකුණු 02 බැගින් 02 × 5 = ලකුණු 10 යි

(vi) සිට (ix) දක්වා කොටස් වලට = ලකුණු 03 බැගින් 04 × 4 = ලකුණු 16 යි

(x) කොටසට = ලකුණු 02 යි

I කොටසට නියමිත මුළු = ලකුණු 28 යි

II කොටස

ප්‍රශ්න අංක 1 සිට 6 වන ප්‍රශ්න සඳහා

(i) වන කොටසට = ලකුණු 04 යි

(ii) වන කොටසට = ලකුණු 06 යි

(iii) වන කොටසට = ලකුණු 08 යි

ලකුණු 18 යි

ප්‍රශ්න අංක 7 සඳහා

(i) වන කොටසට = ලකුණු 03 යි

(ii) වන කොටසට = ලකුණු 07 යි

(iii) වන කොටසට = ලකුණු 08 යි

ලකුණු 18 යි

I	**වැනි කොටස සඳහා**	**ලකුණු**	**28 යි**
II	**වැනි කොටස සඳහා**	**ලකුණු**	**72 යි**
		මුළු ලකුණු	**100 යි**

ලකුණු දීමේ පටිපාටිය

I කොටස

1.

(i)

(අ) වේදයිත සැපය

(ආ) අවේදයිත සැපය

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 ක් සඳහා 01 × 2 = ලකුණු 02 යි)

(ii)

- රූප
- වේදනා
- සඤ්ඤා
- සංඛාර
- විඤ්ඤාණ

(නිවැරදි කරුණු 4ක් සඳහා ලකුණු 02යි, නිවැරදි කරුණු 3ක් සඳහා ලකුණු 02යි, නිවැරදි කරුණු 2ක් සඳහා ලකුණු 01යි)

(iii)

(අ) අනුලෝම

(ආ) පටිලෝම

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 ක් සඳහා 01 × 2 = ලකුණු 02 යි)

(iv)

(අ) මෝඝරාජ මානවකයාට

(ආ) රූප නන්දාවට

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 ක් සඳහා 01 × 2 = ලකුණු 02 යි)

(v)

(අ) පරතෝඝෝෂය

(ආ) යෝනිසෝ මනසිකාරය

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02 ක් සඳහා 01 × 2 = ලකුණු 02 යි)

(vi)

- චක්ඛායතන
- සෝතායතන
- ඝාණායතන
- ජිව්හායතනය
- කායායතනය
- මනායතනය

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4 ක් සඳහා 01 × 4 = ලකුණු 04 යි)

(vii)

- සෘතු
- බීජ
- කම්ම
- ධම්ම
- චිත්ත

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4 ක් සඳහා 01 × 4 = ලකුණු 04 යි)

(viii)

- බුද්ධානුස්සති
- සංඝානුස්සති
- චාගානුස්සති
- ආනාපානසති
- කායගතාසති
- ධම්මානුස්සති
- සීලානුස්සති
- දෙවතානුස්සති
- මරණානුස්සති
- උපසමානුස්සති

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4 ක් සඳහා 01 × 4 = ලකුණු 04 යි)

(ix)

(අ) ප්‍රාතිමෝක්ෂ සංවර සීලය

(ආ) ඉන්ද්‍රිය සංවර සීලය

(ඉ) ආජීව පාරිසුද්ධ සීලය

(ඊ) ප්‍රත්‍ය සන්නිශ්‍රීත සීලය

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4 ක් සඳහා 01 × 4 = ලකුණු 04 යි)

(x) න තං කම්මං කතං සාධු
යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛෝ රෝදං
විපාකං පටිසේවතී

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 28 යි)

II කොටස

1.

(i) චතුරාර්ය සත්‍ය ධර්මය යි.

(ලකුණු 04 යි)

(ii)

- දුඃඛාර්ය සත්‍ය - පිරිසිඳ දැනගත යුතුය (පරිඤ්ඤෙය්‍යං)
- දුඃඛ සමුදයාර්ය සත්‍ය - ප්‍රහාණය කළ යුතුය (පහාතබ්බං)
- දුඃඛ නිරෝධාර්ය සත්‍ය - සාක්ෂාත් කළ යුතුය (සච්ඡිකාතබ්බං)
- දුඃඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාර්ය සත්‍ය - වැඩිය යුතුය (භාවේතබ්බං)

(ලකුණු 06 යි)

(iii) සම්මා ආජීව මාර්ගාංගය යි

ආධ්‍යාත්මික අභිවෘද්ධියට හානිකර නුසුදුසු ක්‍රියාවන්හි යෙදීම මිථ්‍යා ආජීවය යි. එනම් වහල් වෙළෙඳාම වැනි වැරදි වෙළෙදාම් පහෙන් වැළකීම සම්මා ආජීවය යි. පැවිදි ජීවිතය සලකන විට කුහනා, ලපනා ආදී සදොස් ක්‍රමවලින් සිව්පසය සෙවීමෙන් වැළකීම සම්මා ආජීවය යි. ගිහි පැවිදි භේදයකින් තොරව සලකන විට ජීවත්වීම නොයෙකුත් අපරාධ, දූෂණ, කෛරාටික කම්, කුහක කම් නොකොට දැහැමි ජීවිතයක් ගත කිරීම මගින් අධ්‍යාත්මික හා බාහිර අභිවෘද්ධියක් සලසා ගත හැකි බව පිළිතුරෙන් පෙන්වා දීම විය යුතුය.

(ලකුණු 08 යි)

(මුළු ලකුණු 18 යි)

G:\Bauddha Dharmacharya 2024Scheme Darmacharya\For Print\(01) පෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම For Print.docx

2.

(i)
- රාග
- දෝස
- මෝහ
- සද්ධා
- බුද්ධි
- විතර්ක

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4 ක් සඳහා 01 × 4 = ලකුණු 04 යි)

(ii)

- **රාග චරිතයා**

  කරන, කියන කටයුතු ලස්සනට පිරිසිදුව කරන බව රාග චරිතයාගේ ලක්ෂණයකි. රාග චරිතයාට සුදුසු වන්නේ කායගතාසති හා දස අසුභය යන කමටහන් එකොළහ ය.

- **දෝස චරිතයා**

  ද්වේෂය, කෝපය බහුල පුද්ගලයා දෝස පුද්ගලයා යි. අනුන් හා වැඩිකල් මිත්‍රව නොසිටීම, සෑම ක්‍රියාවකදීම කලබල හා බියවන බව ඉක්මණින් වෙනස්වන බව, කටුක ආහාරවලට කැමැති බව දෝස චරිතයාගේ ලක්ෂණයි. මෙත්තා, කරුණා ආදි සතර අප්පමඤ්ඤාවන් හා නීල, පීත, ලෝහිත, ඕදාත, වර්ණ, කසිණ හතරක් ඔහුට ගැලපෙන භාවනා වේ.

- **මෝහ චරිතයා**

  මෝහය බලවත්ව ඇති පුද්ගලයා මෝහ චරිතයායි. ථීන මිද්ධ, උද්දච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන මෙම නීවරණ ද මෝහ චරිතයාට බහුලව ඇත. ගැඹුරු කරුණු තේරුම් ගැනීමට අපොහොසත් බව, කවර දෙයක් වුව ද හරියට කිරීමට අපොහොසත් බව මෝහ චරිතයාගේ ලක්ෂණ යි. මොහුට සුදුසු භාවනාව ආනාපානසතිය යි.

- **සද්ධා චරිතයා**

  ශ්‍රද්ධා අධික තැනැත්තා සද්ධා චරිතය යි. පරිත්‍යාගශීලි බව, ගුණවතුන් දැකීමට කැමැති බව, දහම් අසනු කැමති බව, ප්‍රීතිය බහුල බව මොහුගේ ලක්ෂණයි. බුද්ධානුස්සතිය ඔහුට ගැලපෙන භාවනාවයි.

- **බුද්ධි චරිතයා**

  නුවණ වැඩි තැනැත්තා බුද්ධි චරිතයා යි. සුවච බව, කළන මිතුරන් ඇති බව, සිහිනුවන ඇති බව සෑම කටයුක්තක්ම සිහි නුවණින් කිරීම. ප්‍රඥාවෙන් හා වීර්යයෙන් කටයුතු කිරීම, මොහු චරිත ලක්ෂණ ය. මරණානුස්සතිය, උපසමානුස්සතිය, ආහාරේ පටික්කුල සංඥාව, චතුර්ධාතු ව්‍යවස්ථානය මොහුට ගැලපෙන භාවනා වේ.

- **විතර්ක චරිතයා**

  විතර්ක බහුල තැනැත්තා විතර්ක චරිතයයි. නිතර දොඩමලු ස්වභාවයෙන් යුක්ත වීම, පිරිස් ඇතිව වාසය කිරිමට කැමති බව, ඉක්මන් අදහස් වෙනස් කරන බව, දිනට ම එක දෙයක් කිරීමට නො හැකි බව මොහුගේ ලක්ෂණය යි. ආනාපනාසතිය මොහුට ගැලපෙන භාවනාව යි.

(එක් චරිතයක් හා චරිත ලක්ෂණ සමග සුදුසු භාවනාව දැක්වීමට ලකුණු 1 ½ × 4 = ලකුණු 06 යි)

(iii) ආධ්‍යත්මික වශයෙන් ප්‍රථම ධ්‍යාන ආදී ධ්‍යාන උපදවා ගැනීම ඉක්මවා විදර්ශනා ප්‍රඥාව උපදවා ගැනීමට පසුබිම සකස් වන්නේ සමථ භාවනාවෙනි මේ හැර සමථ භාවනාවෙන් සිත සන්සුන් කර ගැනීමට එකඟ කර ගැනීමට හැකිවීම ඉගෙනීම් කටයුතුත් වෙනත් ක්‍රියාවලටත් සංයමයෙන් නිරවුල් මනසින් ක්‍රියා කිරීමට මෙම සමථ භාවනාවෙන් මඟ සලසයි. මෙවැනි පිළිතුරක් අපේක්ෂිත යි.

(ලකුණු 08 යි)

(මුළු ලකුණු 18 යි)

3.

(i)

- සයංකතං දුක්ඛං - සයංකත වාදය
- පරංකත දුක්ඛං - පරංකත වාදය
- සයංකතං පරංකතං දුක්ඛං - සයංකත පරංකත වාදය
- අසංයං කාරං අපරං කාරං - අසංයංකාර අපරංකාර වාදය

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4 ක් සඳහා 01 × 4 = ලකුණු 04 යි)

G:\Bauddha Dharmacharya 2024Scheme Darmacharya\For Print\(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම For Print.docx

Past Papers Wiki

(ii) (අ) තථ - සත්‍ය වූ තථ්‍ය වූ හෙවත් යථාර්ථවත් සත්‍ය වශයෙන් පවත්නා වූ

(ආ) අවිතථ - අසත්‍ය නොවූ බොරු නොවන

(ඉ) අනඤ්ඤථා - අන් අයුරකට වෙනස් ආකාරයකට පත් නොවන

(ඊ) ඉදප්පච්චයතා - ප්‍රත්‍යයන්ගෙන් ඉන්නා බව

(කරුණු 04 ම ලියා ඇත්නම් පමණක් ලකුණු 06 ලබාදෙන්න)

(iii)

(අ)
- අවිජ්ජා
- සංඛාර
- විඤ්ඤාණ
- නාමරූප
- සළායතන
- ඵස්ස
- වේදනා
- තණ්හා
- උපාදාන
- භව
- ජාති
- ජරා මරණ

(ලකුණු 06 යි)

(ආ)
- හේතුව
- ඵලය

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02 ක් සඳහා 01 × 2 = ලකුණු 02 යි)

(මුළු ලකුණු 18 යි)

4.

(i) නිවන එසේ හඳුන්වනු ලබන්නේ එය දුක නැති කිරීම පිළිබඳ ආර්ය සත්‍ය බැවිනි. ඉන් දුකෙහි නැතිවීම ගම්‍යමාන වන බැවින් ය.

(ලකුණු 04 යි)

(ii)

- **සොපාධිසේස**

  ජීවත්වන රහතන් වහන්සේ නිවන් සුව විඳීම. ''උපධිසේස'' නම් පඤ්චස්කන්ධය ඉතිරිව තිබීමයි. ස්කන්ධ පංචකයෙන් යුත් සත්ත්වයාගේ නිවන් සුව විඳීම ඉන් අදහස් කෙරේ.

- **අනුපධිසේස**

  රහතන් වහන්සේගේ පිරිනිවන් පෑම මින් අදහස් කෙරේ. රහතන් වහන්සේගේ පංචස්කන්ධය අවසන් වීම පරිපූර්ණ නිවන් සුවය ලෙස සලකනු ලැබේ.

(එක් හැඳින්වීමකට ලකුණු 03 බැගින් හැඳින්වීම් 2 ක් සඳහා 03 × 2 = ලකුණු 06 යි)

G:\Bauddha Dharmacharya 2024Scheme Darmacharya\For Print\(01) පෙරවැදි බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම් For Print.docx

(iii) සීල, සමාධි හා ප්‍රඥාව යන ත්‍රිශික්ෂාව අනුපූර්ව ආකාරයෙන් විස්තර කිරීම අවශ්‍ය වේ. ආර්යය අෂ්ටාංගික මාර්ගය ත්‍රි ශික්ෂාවට නිවැරදිව බෙදා දක්වමින්, එම ත්‍රි ශික්ෂාව වෙන් වෙන්ව පහදා තිබේ නම් සම්පූර්ණ ලකුණු දෙන්න.

(ලකුණු 08 යි)

(මුළු ලකුණු 18 යි)

5.

(i)

- වේද යුගය
- බ්‍රාහ්මණ යුගය
- උපනිෂද් යුගය
- ජෛන කර්මවාදය

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 04 ක් සඳහා 01 × 4 = ලකුණු 04 යි)

(ii)

- දිට්ඨධම්ම වේදනීය කම්ම - කුසල අකුසල වශයෙන් මෙලොව දීම විපාක දෙන කර්ම.
- උප්පජ්ජ වේදනීය කම්ම - මව්පියන් මරණයට පත් කිරීම වැනි ආනන්තරිය කර්ම දෙවන භවයේ දී විපාක දීම.
- අපරාපරිය වේදනීය කම්ම - සාමාන්‍ය කුසල හෝ අකුසල කර්ම සසරේ ඕනෑම ආත්ම භවයක දී විපාක දීම.

(නිවැරදි එක් කරුණක් නම් කිරීමට හා පැහැදිළි කිරීමට ලකුණු 02 බැගින් කරුණු 3 ක් සඳහා ලකුණු 06 යි)

(iii) හිතාමතා ක්‍රියා කිරීමට හා තීරණ ගැනීමට නිදහස ලබා දීමයි. වගකීම පැවරීම යි. අනෙකුත් ආගම් හා දර්ශනවල ද මේ ස්වභාවය නැත. විශේෂයෙන් ම හිතාමතා කර්ම කිරීම නිසා හොඳ හෝ නරක ක්‍රියාවල ප්‍රතිඵල තමා ලැබීය යුතුය. පින හා පව වශයෙන් මෙය බෙදී යයි. ඒ නිසා එයින් ලබන කටුක හෝ මිහිරි විපාක තමාට අයත් වේ. විශේෂයෙන් ම හිතාමතා කරන එම ක්‍රියා චේතනා හා සම්බන්ධ වේ.

(ලියා ඇති පිළිතුරු සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙන්න)

(ලකුණු 08 යි)

(මුළු ලකුණු 18 යි)

G:\Bauddha Dharmacharya 2024Scheme Darmacharya\For Print\(01) පෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම For Print.docx

Past Papers Wiki

6.

(i)

(අ) ත්‍රිලක්ෂණය යි.

(ලකුණු 01 යි)

(ආ)

- අනිත්‍ය
- දුක්ඛ
- අනාත්ම

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 03 ක් සඳහා 01 × 3 = ලකුණු 03 යි)

(ii) කැඩෙන, බිඳෙන අර්ථයෙන් ලෝකයයි කියනු ලැබේ. ලුජ්ජති පලුජ්ජති ලොකෝ යනුවෙන් ධර්මයේ දී විග්‍රහ කොට ඇත. කෙටියෙන් දක්වත හොත් මෙහි ලෝක යනුවෙන් හඳුන්වන්නේ ස්කන්ධ පංචකය යි. එම ස්කන්ධ පංචකයට අයත්, ඇස, රූප, චක්ඛු, විඤ්ඤාණය, චක්ඛු සම්පත්තිය යන සියල්ල ද නැසේ යං කිංචි සමුදාය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං යන පාඨයෙන් ද විග්‍රහ කරන්නේ හට ගැනීමේ ස්වභාවය ඇති හැම දෙයක් ම වෙනස්වීමේ ස්වභාවය ද ඇතිව පවතින බවයි.

(මෙසේ දක්වා ඇති විග්‍රහයට ලකුණු 06 යි)

(iii) සංස්කාර හෙවත් සංඛාර යනු කුමක්දැයි හඳුන්වන බුදුරජාණන් වහන්සේ එහි ලක්ෂණ තුනක් ඇති බව පෙන්වා දෙයි.

උපත, හෙවත් හටගැනීම, විනාශය හෙවත් නැතිවීම උපත හා වෙනස්වීම අතර ලක්ෂණය. මේවා පාළියේ දී උප්පාද වෙති. භංග යනුවෙන් දක්වා ඇත. මෙහි උපත නම් ජාතිය යි. විනාශය නම් මරණය යි. උපතේ පටන් මරණය දක්වා පැවැත්මෙහි අන්‍ය බවට පත්වීමක් වෙනස්වීමක් දක්නට ලැබීම පැවැත්මේ අන්‍ය බවට පත්වීමයි. ස්කන්ධ පංචකයට අයත් සෑම ස්කන්ධකයට පවත්නා අස්ථිරත්වය හා අනිත්‍ය බව මෙමගින් පෙන්වා දී ඇත. අනත්ත ලක්ඛණ සූත්‍රයේ දී මේ බව මැනවින් දක්වා ඇත.

(ලියා ඇති කරුණු සැලකිල්ලට ගෙන ලකුණු 08 යි)

(මුළු ලකුණු 18 යි)

PAST PAPERS WIKI

7.

(i) අත්තබ්‍යාදාය සංවත්තති - තමාගේ විපතට හේතු වීම

පරබ්‍යාදාය සංවත්තති - අනුන්ගේ විපතට හේතු වීම

උභයබ්‍යාදය සංවත්තති - තමන්ගේ හා අනුන්ගේ විපතට හේතුවීම

මේ හැර කුසලා කුසල විනිශ්චය සඳහා ඉවහල්වන තවත් පරීක්ෂණ ක්‍රම තුනක් අංගුත්තර නිකායේ දැක්වේ.

- අත්තාධිපතෙය්‍ය
- ලෝකාධිපතෙය්‍ය
- ධම්මාධිපතෙය්‍ය

(මේ ක්‍රම දෙකෙන් කවර හෝ එක් ක්‍රමයක් ලියා ඇති නම් ලකුණු දෙන්න)

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 3 ක් සඳහා 01 × 3 = ලකුණු 03 යි)

(ii) බුදු දහමෙහි දස කුසල් හා දස අකුසල් වශයෙන් ප්‍රභේදයක් ඇත. මේ දස කුසල් හා අකුසල් කායික, වාචසික හා මානසික වශයෙන් ප්‍රකාශයට පත්වන බව බුදු දහම උගන්වයි.

කායික - ප්‍රාණඝාත, අදත්තාදාන හා කාමමිථ්‍යාචාර

වාචසික - මුසාවාදය, පරුෂවචනය, කේලාම් කීම

මානසික - අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යා දෘෂ්ඨි

මෙහි දී විශේෂයෙන් අපේක්ෂා කරන්නේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ එන කරුණුවලට කුසල හා අකුසල සම්බන්ධ කර දැක්වීමයි.

(ලකුණු 07 යි)

(iii) බුදු දහමෙහි ඉගැන්වෙන සදාචාර ශික්ෂාව (ශීලය) ප්‍රගුණ කිරීම මගින් බලාපොරොත්තු වන්නේ දස අකුසලයන්ගෙන් දුරුවීමත්, එම චර්යාවන් මෛත්‍රී සහගත ක්‍රියාවන් මගින් වෙනස් කරලීමත් ය. වෙනත් අයුරකින් දක්වතොත් බුදු සමයේ සදාචාර ජීවිතය ලෙස හඳුන්වන්නේ ඉහත කී අකුසලයන්ගෙන් වැළකීමයි. මෙම අකුසල ක්‍රියා නිසා තමාටත් මෙන්ම සමාජයටත් අයහපතක් පවතිනවා පමණක් නොව සමාජ විරෝධී, සමාජ දූෂණයන් ද ඇති කරයි. හොඳ, යහපත සංවර්ධනය කිරීමෙන් සමාජ යහපත සලසා ගත හැකි බව සඳහන් කළ හැක.

(පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු ලබා දෙන්න)

(ලකුණු 08 යි)

(මුළු ලකුණු 18 යි)

******

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library